ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 25th April 2023 |

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | ජේ.ඒස්.එන් .ප්‍රනාන්දු මිය<br>162/4/සී/1,<br>කඩවල පාර,<br>පන්නිපිටිය. |
| අගතියට පත් පුද්ගලයා | : | ආර්.පී.වජිර කුමාර මයා |
| වගඋත්තරකාර පාර්ශවය | : | පො.ප.ධර්මප්‍රිය මහතා,<br>විශේෂ කාර්ය බලකාය,<br>රාජගිරිය. |

***පැමිණිලි අංකය : HRC/2819/17, HRC/2637/17, HRC/2602/20***

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ, 2017.08.12 වන දින තම ස්වාමි පුරුෂයා වන ආර්.පී. වජිර කුමාර යන අය මීගමුව සිට ඔහුගේ නිවස වෙත පැමිණෙමින් සිටියදි වෑන් රථ දෙකකින් සහ ඩිපෙන්ඩර් වර්ගයට අයත් ජීප් රථයකින් සහ යතුරුපැදි වලින් සමන්විත විශේෂ කාර්යය බලකා සෙබලුන් 25 ක් 30 ක් අතර ප්‍රමාණයක් ඔහු සහ තවත් තිදෙනෙකු පැමිණි වෑන් රථය හරස්කොට රථයට වෙඩි තබා පාර අද්දර තිබුණු කාණුවට වැටී රථය නැවතුණ පසු දොරවල් ඇර තම ස්වාමියා එයින් එළියට ගෙන ඔවුන් පැමිණි වෑන් රථය ලගට ගෙන ගොස් හිසට සහ ඇස් දෙකට වෙඩි තබා පසුව ඉල ප්‍රදේශයට පිහියකින් ඇන ඇති බවයි, පසුව ඔහුව පිළිවෙලින් සීදූව රෝහලටත් එයින් පසු රාගම මහ රෝහලටත් ඉන්පසු එදිනම කොළඹ ජාතික රෝහලටත් මාරු කරන ලද බවද, එහිදි ඔහු දැඩි සත්කාර ඒකකයේ සහ 19 වැනි වාට්ටුවෙන් ප්‍රතිකාර ලබා එයින් පසු කොළඹ බන්ධනාගාර රෝහලටත් මාරු කර එහිදී ද ප්‍රතිකාර ලැබූ බවත්, දැනට ඔහු හට ඔහුගේ කිසිම ක්‍රියාකාරකමක් තනිව කර ගැනීමට නොහැකි තත්වයකින් දෙනෙත් අන්ධව අසරණ වී සිටින බවත් සදහන් කර ඇත. තවද තම ස්වාමියා හට ව්‍යාජ චෝදනා රාශියක් ගොනු කොට අධිකරණයට ඉදිරිපත් කිරිමට සැලසුම් කොට ඇති බවත්, දන්වා ඇති අතර, මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කර සහනයක් සලසා දෙන ලෙසට ඉල්ලා ඇත.

තවද තමන්ගේ ස්වාමියාගේ දෑස යලි ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමේ කිසිදු හැකියාවක් නොමැති බවට වෛද්‍යවරුන් නිර්දේශ කර ඇති බවට සඳහන් කරන අතර, එකී වෛද්‍ය වාර්තාව කොමිසම වෙත ඉදිරිපත් කර ඇත. තම ස්වාමියා ඇතුළු පිරිස ගමන් කරමින් සිටි වාහනයේ කිසිදු ගිණි අවියක් නොතිබූ බවත්, විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් පවසන ආකාරයට වෙඩිතැබීමක් වෑන් රථය තුල ගමන් කරමින් සිටි පිරිස වෙතින් සිදුවූයේ නම් එම නිලධාරීන් පැමිණි ඩිෆෙන්ඩර් රථයට වෙඩි වැදීමක් සිදුවී තිබිය යුතු වුවද, එවැනි කිසිදු සිදුවීමක් සිදුවූ බවට පිළිගත නොහැකි බවත් පැමිණිලිකාරිය වැඩිදුරටත් සඳහන් කර ඇත.

අගතියට පත් පුද්ගලයාගේ ප්‍රකාශය :-

**2019.03.11 දින කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේදී මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් අගතියට පත් වජිර කුමාර යන අයගෙන් ලබා ගත් ප්‍රකාශයේ අන්තර්ගත කරුණු -**

අගතියට පත් රංහොටිගේ ගෙදර වජිරකුමාර යන අය විසින් සිය කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මැණික් ව්‍යාපාරිකයෙකු වන තමා 2017.08.12 වන දින සවස 3.00 ට පමණ තමාගේ පවුලේ අයට ඇඳුම් ගැනීම සඳහා තම මිතුරන් තිදෙනෙක් ද සමග මිතුරෙකුට අයත් රථයකින් මීගමුව ප්‍රදේශයට ගිය බවයි. එහි යන අතරතුර තමා මීගමුව රෝහල ඉදිරිපිට ඇති කඩයකින් ඇඳුම් රැගෙන සවස 4.45 ට පමණ නැවත සීදූව දෙසට ගමන් කරමින් සිටියදී කුරණ ප්‍රදේශය ආසන්නයේ තමාගේ වාහනයට පිටුපසින් නලාව ශබ්ද කරමින් වාහනයක් පැමිණි අතර, තමා පිටුපස බැලූවිට විදුලි ලාම්පු දල්වා ගනිමින් ජීප් රථයක් තමන්ගේ වාහනය ආසන්නයට පැමිණ වාහනය අයින් කරන ලෙස හස්ත සංඥා මගින් දන්වා සිටි බවත්, තමා වෑන් රථය අයින් කර ගත් පසුව තමාගේ වාහනය හැප්පු බවත්, එම අවස්ථාවේදී පාර අයිනේ තිබූ කාණුවකට තමා පදවන ලද රථය වැටුණු බවත් සඳහන් කර ඇත. ඒ සමගම තම රථය පිටුපසින් එක දිගටම වෙඩි තබමින් පුද්ගලයින් 15 ක් පමණ තම වාහනය ආසන්නයට පැමිණි විට වෙඩි පහරවල් වාහනය තුලට වැදුණු බව තමා හට ඇසුණු හෙයින් බියට පත්වූ තමා පිටුපස දොර ඇර එළියට පැන බිම වැටුනු බවත්, එම අවස්ථාව වනවිටත් පිටපුසින් පැමිණි පුද්ගලයින් වාහනයට දිගටම වෙඩි තබමින් තමාව අල්ලාගෙන තමා හට පිස්තෝලය දික් කරගෙන "මෙක අතට ගනින් මේවාගේ පිස්තෝලවලින් නේද අපේ නිලධාරින්ට ගැහැව්වේ කියා" පවසමින් "දැන් පුලුවන් නම් මේවා අරගෙන ගිහින් වෙඩි තියපන්" කියා කලුපාට පිස්තෝලයක් තමාට දික් කරමින් සිටි බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී ඔහු විසින් එම පිස්තෝලය හා පුද්ගලයාව පැත්තකට තල්ලු කර දැමූ අතර, ඒ සමගම තමාගේ වම් ඇසට කව්දෝ කෙනෙක් වෙඩි තැබූ බවත් එම අවස්ථාවේදී තමා බිම ඇද වැටුණු බවත්, තමාගේ දකුණු ඇසට ආසන්නව ද වෙඩි හඬක් ඇසුණු බවත්, ඉන්පසුව තමා බිම වැටුණු බවත්, හිසට යකඩ ආයුධ වලින් පහර දුන් අතර, තමාව වාහනයකට දමා ගෙන යන බව තමාට දැණුනු බවත් ප්‍රකාශ කර ඇත.

පසුව තමාව විජේකුමාරතුංග අනුස්මරණ රෝහලට ඇතුලත් කල ද එහි ප්‍රතිකාර ගැනීමට පහසුකම් නොමැති නිසා රාගම රෝහලට ඇතුලත් කරන ලද බවත්, එහිදී වෙඩි තැබූ විශේෂ කාර්යය බලකායේ නිලධාරින් වෛද්‍යවරුන්ට තමා හට ප්‍රතිකාර ලබාදීමට බාධා පමුණුවමින් තර්ජණය කරන ලද බවත්, එම නිසා පසුව තමාව කොළඹ ජාතික රෝහලට මාරු කර යැවූ බවත් සඳහන් කර ඇත. ජාතික රෝහලේ හදිසි ප්‍රතිකාර අංශයේ (අයි.සී.යූ) දින 30 ක් පමණ රඳවා තබා ගනිමින් තමාගේ ජීවිතය බේරා ගැනීම සඳහා වෛද්‍යවරුන් උත්සහ කල බව ද සඳහන් කර ඇති අතර, එම රෝහලේ වෛද්‍යවරුන් හට ද අදාල විශේෂ කාර්යය බලකායේ වෙඩි තැබූ නිලධාරින් විසින් තර්ජනය කර සවිකර තිබූ ජීවිත ආරක්ෂක උපකරණ පවා ගලවා දමන ලෙස ඔවුන්ට දැනුම් දුන් බව තමාට සිහිය ලද විට දැන ගැනීමට ලැබුනු බව ද

සදහන් කර ඇත. එසේම තමාව වාහනයකින් රෝහල වෙත රැගෙන යන අතරතුර උදරයේ වම් ප්‍රදේශයට පිහියක් වැනි මොට ආයුධයකින් ඇණ තිබූ අතර, මූබය විවර කර වෙඩි තබා ඇති බව ද පසුව දැන ගත් බවත්, මේ වන විට තමාගේ දැස් නොපෙනෙන බවත් සදහන් කර ඇත.

විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් තමාව ඝාතනයට තැත් කිරීමට හේතුව වූයේ 2017.05.09 වන දිනට ආසන්න දිනයකදී පිළියන්දල ප්‍රදේශයේ දී පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශයේ සේවය කරන රංගජීව යන නිලධාරියාට යම් කිසි පිරිසක් විසින් වෙඩි තැබීමෙන් ඔහුට බරපතල තුවාල සිදු වීමත්, එම වෙඩි තැබීම තමා විසින් සිදු කර ඇති බවට තමාගේ විරුද්ධවාදීන් විසින් පොලිසියට වැරදි තොරතුරු ලබා දී ඇති තිබීමත් හේතුවෙන් බවත්, සදහන් කර ඇත. එම වෙඩි තැබීම සම්බන්ධයෙන් සිදුකළ මූලික පරීක්ෂණ වලින් ලබා ගත් සීසී ටීවී දර්ශන වලදී ද වෙඩිතැබූ පුද්ගලයා තමාට සමාන පුද්ගලයෙකු බවට වූ සාක්ෂි පදනම් කොට තමා විසින් රංගජීව මහතාව ඝාතනය කිරීමට උත්සහ කළ බව සිතා තමාව ඝාතනය කිරීමට ප්‍රයත්න කළ බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

තවද තමා ගමන් ගත් වාහනයේ අවි ආයුධ තිබූ බවට අධිකරණයට ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් අධිකරණය නොමග හරිමින් එල්/46441/17 දරණ නඩුවේ සැකකරුවෙකු ලෙසට තමාව බන්ධනාගාර ගත කරන ලද බව ද, මෙම සිදුවීම සම්බන්ධයෙන් මීගමුව අංක 1 ම/උ වෙත කරුණු ඉදිරිපත් කර සිටි අතර, ඒ පිළිබදව පරීක්ෂණයක් කර අධිකරණයට ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින් මීගමුව පොලිස් ස්ථානයට නියෝගයක් ලබා දී ඇති බවත්, මේ වනතෙක් කිසිදු වාර්තාවක් ඉදිරිපත් කර නොමැති බවත් සදහන් කර ඇත. මෙම සිදුවීමට අදාළ සැකකරු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඔහු බන්ධනාගාරයෙන් ඇප මත නිදහස් වී පිටව ගොස් ඇති නමුත් තමා මෙම සිදුවීමෙන් පසු වසර 1, 1/2 ක් පමණ බන්ධනාගාරයේ සිටින බවද මේ සම්බන්ධව සාධාරණයක් ඉටු කර දෙන ලෙසද ඉල්ලා සිට ඇත.

වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇති කරුණු :-

මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සදහන් කර ඇත්තේ, රාජගිරිය විශේෂ කාර්ය බලකා කදවුරේ පො.ප. ධර්මප්‍රිය නිලධාරියාට ඔහුගේ පුද්ගලික ඔත්තුකරුවකු විසින් ලබා දෙන ලද තොරතුරක් මත සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමක් විසින් මහා පරිමානයෙන් මත්ද්‍රව්‍ය ජාවාරම්, කප්පම් ගැනීම් හා කොල්ලකෑම් සිදු කරන බවට ලද තොරතුරට අනුව ඒ සම්බන්ධව විමර්ශනයක් සිදුකර ඇති බවත්, එම විමර්ශනයේදී මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු වන මාතර මදූෂ් ලක්ෂිත යන අය සමග සම්බන්ධකම් පවත්වන අපරාධ කල්ලි සාමාජිකයින් පිරිසක් කුරණ ප්‍රදේශයට පැමිණ සිටින බවට ලැබුණු තොරතුරට අනුව පො.ප. ධර්මප්‍රිය නිලධාරියා ඇතුලු විශේෂ කාර්ය බලකා නිලධාරින් කණ්ඩායමක් මීගමුව කුරණ ප්‍රදේශයට ගොස් ඒ සම්බන්ධයෙන් ආවේක්ෂන රාජකාරි වල නිතර වී ඇති බවත්ය. ඒ අවස්ථාවේදී පුද්ගලික ඔත්තුකරුගෙන් ලද තොරතුරට අනුව එම සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායම පැමිණි වාහනය හලාවත කොළඹ ප්‍රධාන මාර්ගයේ කුරණ ඉන්ද්‍රා ට්‍රේඩර්ස් වාහන ආයතනය ඉදිරිපිට නවතා තිබෙන බවට ලද තොරතුරට අනුව ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර ඇති බවත්, අදාළ තොරතුරට අනුව එම ස්ථානයේ වෑන් රථය නවතා තිබී ඇති අතර, එම වෑන් රථය පරීක්ෂා කිරීම සඳහා නිලධාරින් යොදවා ඇති බවත් සදහන් කර ඇත. විශේෂ කාර්ය බලකා නිලධාරින් එම වාහනය පරීක්ෂා කිරීම සඳහා උත්සහ දරණ අවස්ථාවේදී වාහනය තුළ සිටි සැකකරුවන් විසින් ගිනි අවි වලින් විශේෂ කාර්ය බලකා නිලධාරින් දෙසට වෙඩි තබා ඇති අතර, එම වෙඩි පහර වලින් වැලකීම සඳහා විශේෂ කාර්ය බලකා නිලධාරින් ද සැකකරුවන් දෙසට වෙඩි ප්‍රහාර එල්ල කර ඇති බවත්, ඒ සමගම සැකකරුවන් පැමිණි වෑන් රථය පලා යාමට උත්සහා දරා ඇති අතර

විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් වාහනයේ ටයර් වලට වෙඩි තබා වාහනය නවතා ගැනීමට සමත් වී ඇති බවත් සඳහන් කර ඇත. පසුව විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් වෑන් රථය පරීක්ෂා කිරීමේදී වෑන් රථය තුළ සිටි රත්හොටිගේ වජිර කුමාර නොහොත් වජිර, පතිරණ මුදියන්සේලාගේ චම්පික කුමාර ජයතුංග යන දෙදෙනා තුවාල ලබා සිටි හෙයින් ඔවුන් දෙදෙනාම මාර්ගයේ ගමන් කළ ත්‍රිරෝද රථ දෙකක් නවතා විශේෂ කාර්ය බලකා නිලධාරීන් භාරයේ සීදුව විජයකුමාරතුංග රෝහල වෙත යවා ඇති බවත්, ඉන්පසුව වෑන් රථය පරීක්ෂා කර ඇති අතර, වෑන් රථය තුළ වෙලමැද ගෙදර අරුණ ශාන්ත, අලවත්ත කංකානම්ලාගේ තරිදු මදුෂ යන දෙදෙනා සිට ඇති අතර පො.ප. ධර්මප්‍රිය නිලධාරියා විසින් ඔවුන් දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇති බවත් සඳහන් කර ඇත.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් දෙදෙනා මීගමුව ම/උ එල් 46441/17 යටතේ ගරු අධිකරණයට ඉදිරිපත් කර දින 07 ක් රැඳවුම් නියෝග ලබාගෙන විමර්ශනය කිරීමට කටයුතු කර ඇති අතර, තුවාල ලබා රෝහල් ගත කරන ලද රත්හොටිගේ වජිර කුමාර නොහොත් වජිර, පතිරණ මුදියන්සේලාගේ චම්පික කුමාර ජයතුංග යන සැකකරුවන් දෙදෙනා ඉහත නඩු අංක යටතේ රාගම රෝහලේ සහ කොළඹ මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී ගරු මහේස්ත්‍රාත්තුමාගේ නියෝග පරිදි බන්ධනාගාර භාරයට පත්කළ බවත් දක්වා ඇත.

වෛද්‍ය වාර්තාවේ සඳහන් කරුණු :-

අගතියට පත් වජිර කුමාර යන අයට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, එම වාර්තාවට අනුව වම් හා දකුණු ඇස් දෙකට හානි සිදු වී ඇති අතර, අභ්‍යන්තර හා බාහිර තුවාල පිළිබඳව පහත සඳහන් ආකාරයට කරුණු දක්වා ඇත.

1. වම් ඇසට බරපතල ලෙස තුවාල සිදු වී ඇත.
2. නාස් පොල්ල බිඳී ගොස් ඇත.
3. නාස් පොල්ලේ ඉදිරිපස කැඩී ඇති අතර, හිසේ තලල ප්‍රදේශයද හානි වී ඇත.
4. වම් ඇස සම්පූර්ණයෙන්ම හමෙන් වැසී ඇත.
5. දකුණු ඇසට තුවාල සිදුව ඇත.
6. නාසයට සිදු වී ඇති හානිය නිසා හුස්ම ගැනීමේ අපහසුතාවයට පත්ව ඇත.
7. ඇස් දෙකේම පෙනුම ස්ථිරවම හා සම්පූර්ණයෙන්ම දුර්වල තත්වයට පත්ව ඇත. (පෙනුම අහිමි වී ඇත)
8. තලල ප්‍රදේශයේ සිදු වී ඇති හානිය නිසා යම් යම් අවස්ථාවලදී ඔලුවේ වේදනාවන් වලට මුහුණ දීමට සිදු වීමටද හැකියාව ඇත.

වෛද්‍ය වාර්තාව අනුව දැනට ඔහුගේ මානසික හා ශාරීරික තත්වය -

1. ඔහුගේ ඇස් දෙකම නොපෙනෙන තත්වයට පත්ව ඇත.
2. වම් ඇස සම්පූර්ණයෙන්ම හමෙන් වැසී දකුණු ඇසට කෘත්‍රිම ඇසක් බද්ධ කර ඇත.
3. ඔහුගේ මතක ශක්තිය දුර්වල වී ඇති බව කරුණු අනුව අනාවරණය වී ඇත.
4. ඇස් සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරුන් විසින් ඔහුගේ මුහුණට සිදුව ඇති තුවාල හා ඇස් අනුව පෙනීම නැවත ලබාදීමට දේශීයව හෝ විදේශයකදී ශල්‍යකර්මයක් සිදු කිරීමේ හැකියාවක් නොමැති බවට නිර්දේශ කර ඇත.

මේ අනුව ඔහුගේ ඇස් දෙකේ පෙනීම සම්පූර්ණවම අහිමිව ගොස් ඇති බවට සඳහන් කර ඇති වෛද්‍යවරුන්ගේ නිර්දේශයට අනුව ඔහුගේ තුවාලයේ බරපතලකම හා හානිය අනාවරණය වී ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා වන රත්හොටි ගෙදර වජිර යන අය ඔහුගේ මිතුරන් දෙදෙනෙකු සමග අංක 205-9269 දරණ වෑන් රථයකින් මීගමුවට ගොස් ආපසු එමින් සිටියදී කොළඹ මීගමුව ප්‍රධාන මාර්ගයේ කුරණ ප්‍රදේශයේ එම වාහනය හඹා ගොස් විශේෂ කාර්යය බලකායේ නිලධාරින් විසින් සිදු කර ඇති වෙඩි ප්‍රහාරයකින් වාහනයට හා එම වාහනයේ සිටි පුද්ගලයින්ට හානි සිදුව ඇති බවට කරුණු අනාවරණය වී ඇත.

වගඋත්තරකරුවන් විසින් ඔවුන් පැමිණ ඇති වාහනයට මෙම පුද්ගලයා විසින් වෙඩි තැබීමක් කර ඇති බවට ප්‍රකාශ කර ඇති නමුත්, අදාල සිද්ධිය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි සාක්ෂියක් වන CCTV දර්ශන අනුව එසේ වෙඩි තැබීමක් සිදු වී නොමැති බවට කරුණු අනාවරණය වේ. තවද වගඋත්තරකරුවන් විසින්ද එසේ වෙඩි තැබීමක් සිදු වූ බව තහවුරු කිරීම සඳහා කිසිදු පිළිගත හැකි සාක්ෂියක් ඉදිරිපත් කර නොමැත.

මෙම සිදුවීම සම්බන්ධව 2017.08.12 දින හිරු මාධ්‍ය ඔස්සේ විකාශය වූ වීඩියෝ පටය නිරීක්ෂණය කිරීමේදීද වගඋත්තරකරු වන විශේෂ කාර්යය බලකායේ නිලධාරින් පැමිණ සිටි ඩිෆේන්ඩර් රථයට වින්දිතයා විසින් වෙඩි තැබීමක් සිදු කළ බව තහවුරු කිරීමට කිසිදු සළකුණක් හෝ සාක්ෂියක් නොමැති බවට කරුණු නිරීක්ෂණය වන අතර, එදින පැමිණි විශේෂ කාර්ය බලකායේ නිලධාරියෙකුටද කිසිදු වෙඩි තැබීමක් සිදු කර ඇති බවට හෝ වෙඩි තැබීමකින් ප්‍රතිකාර ලබා ගත් බවට කරුණු අනාවරණය වී නොමැත. එබැවින් වින්දිතයා විසින් එසේ වෙඩි තැබීමක් සිදු කර ඇති බව කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් වී ඇති කරුණු අනුව තහවුරු නොවේ.

මෙම ප්‍රහාරය එල්ල කර ඇත්තේ ඔහුව අත්අඩංගුවට ගැනීම සඳහා එම ස්ථානයට ජීප් රථයකින් පසුපසින් පැමිණි විශේෂ කාර්යය බලකායේ නිලධාරින් විසින් බවටද කරුණු හෙළි වී ඇත.

තවද පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය, වෛද්‍ය වාර්තාව හා හානියට ලක් වූ පුද්ගලයා විසින් සිදු කර ඇති ප්‍රකාශ වලින් පැමිණිල්ලේ දක්වනු ලබන සිදුවීමක් සිදුව ඇති බව කරුණු අනුව තහවුරු වී ඇත.

මෙම වෙඩි ප්‍රහාරයේදී වෑන් රථයේ සිටි පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයාට වෙඩි වැදීමක් සිදුව ඇති බවට අනාවරණය වී ඇත. ඒ අනුව එම වෙඩි වැදීමේදී එම පුද්ගලයාගේ මුහුණට, හිසට, නාසයට හා නළලට බරපතල තුවාල සිදු වී ඇති බවට කරුණු අනාවරණය වී ඇත.

තවද ඔහු සමග ගමන් කර ඇති මිතුරන් වන චම්පික කුමාර ජයතුංග යන අයගේ දිවුරුම් ප්‍රකාශයට අනුව, අගතියට පත් අය සමග තවත් මිතුරන් දෙදෙනෙක් 205-9269 දරණ වෑන් රථයෙන් මීගමුව නගරයට ගොස් ආපසු එමින් සිටියදී එම වෑන් රථයට වෙඩි ප්‍රහාරයක් එල්ල වූ බව ප්‍රකාශ කර සිටින අතර, නිරායුධව සිටි චම්පික කුමාර සහ වජිර කුමාර යන අයට ඔවුන් අසභ්‍ය වචනයෙන් බැණ වැදි ඉතා ද්වේශ සහගතව වෙඩි තැබීමක් සිදු කළ බවට සඳහන් කර ඇත.

එසේම මෙම සිදුවීමෙන් පසුව කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් අගතියට පත් වජිර කුමාර යන අය නිරීක්ෂණයට ලක්කර ඇති අතර, එහිදී නිරීක්ෂණය වූ කරුණු අනුව අදාල වෙඩිතැබීම හේතුවෙන් ප්‍රකෘතියට පත් කළ නොහැකි ආකාරයෙන් අගතියට පත් පුද්ගලයාට ශාරීරිකව හානි වී ඇති බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

මෙකී සමස්ත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කොට ආරක්ෂා දී ඇති අගතියට පත් තැනැත්තාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

එබැවින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්, වගඋත්තර පාර්ශවයේ මෙකී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙම නිර්දේශය පොලිස්පති වෙත යොමු කරනු ලැබේ.

2023 . 05 . 31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.ගේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Human ... Sri Lanka

පිටපත : 01. සභාපති,
පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

02. නියෝජ්‍ය පොලිස්පති (නීති),
පොලිස් මූලස්ථානය,
කොළඹ.

B/.